# 11

# සිරිලක කප් රුක

**සිරිලක කප්රුක යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන පොල් ගස පිළිබඳ ව, භාෂා සාහිත්‍යික, සාමාජික හා ආර්ථික ඉසව් ඔස්සේ කරුණු සම්භාරයක් ඉදිරිපත් කෙරෙන පාඩමකි මේ.**

**විවිධ විෂය යටතේ ලියවුණු ලිපි ලේඛන සාරාංශ කර ලිවීමේ හැකියාව සංවර්ධනය කර ගැනීමටත් වාක්කෝෂය හා භාෂාව වර්ධනය කර ගැනීමටත් මේ පාඩම උපකාර වනු ඇත.**

සොබා දහමේ සුපිරි වෙළෙඳසල වශයෙන් ඉංග්‍රීසි ජාතිකයන් විසින් හඳුන්වනු ලබන පොල් ගස ලෝක ජන සංඛ්‍යාවෙන් පහෙන් එකකට ප්‍රයෝජනවත් වන මහඟු වෘක්ෂයකි. 'කොකස්නුසිෆෙරා' (cocos nucifara) යනු පොල් ගසෙහි විද්‍යාත්මක නාමය යි. මේ වන විට ලෝකයේ රටවල් අනූතුනක හෙක්ටාර් මිලියන 11.8ක් පමණ වූ අතිවිශාල භූමි ප්‍රමාණයක පොල් වගාව සාර්ථක ලෙස ව්‍යාප්ත ව ඇත. එම රටවල් අනූ තුනෙහි පොල් එලදාව වර්ෂයකට පොල් ගෙඩි බිලියන 57514ක් පමණ වන අතර එම පොල් අස්වැන්නෙන් නිපදවන කොප්පරා ප්‍රමාණය වර්ෂයකට ටොන් බිලියන දහසය යි දශම පහ යි හතක් පමණයැ'යි ගණන් බලා ඇත.

පොල් ගසේ මාතෘ භූමිය ලෙස සැලකෙන්නේ මලයාසියාව යි. ලොව බහුතර ජනතාව විශ්වාස කරන්නේ මලයාසියාවේ හටගන්නා පොල් අවට සාගරයේ දිය රැලි දිගේ පාවී ගොස් සෑම රටක ම ව්‍යාප්ත වන්නට ඇති බවයි.

මෙරට ඉතිහාසයෙහි ද පොල් ගස ජනප්‍රිය වෘක්ෂයක් ව පැවති බව ලිඛිත සාක්ෂ්‍ය විමර්ශනය කිරීමේ දී පෙනී යයි. බ්‍රාහ්මී ලිපිවල පොල් හඳුන්වා ඇත්තේ "නාඩීර" යනුවෙනි. සිදත් සඟරාවේ "නැළි" වශයෙන් ද සීගිරි ගීවල "නෙළිඑල" වශයෙන් ද පොල් හඳුන්වා ඇත.

ශ්‍රී ලංකාවේ පොල් ගසෙහි ඉතිහාසය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එය විජයාවතරණය දක්වා ඈතට දිවයන බව පෙනේ. ඒ පිළිබඳ තොරතුරු මහාවංසයේ සඳහන් වේ. එනම් ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු පිරිසට කුවේණියගෙන් කුරුම්බා වතුර සංග්‍රහයක් ලැබීම යි. එහි කුරුම්බා වතුර හඳුන්වා ඇත්තේ 'කසපැන්' යනුවෙනි. ථූපවංසයෙහි ද කුරුම්බා වතුර කසපැන් ලෙස හඳුන්වා ඇත. ඒ මෙසේ ය.

''ඉක්බිති රජ්ජුරුවෝ කර්මාන්ත කරන සියලු පර්ෂදට මිල පිණිස වාසල් දොරෙක සොළොස් දහසක් රන් ද, පිළිසම්බඩම් ද, ආභරණ ද, සුවඳ ද, පලඳනා ද, මල් ද, තෙල්, මී සකුරු, උක්, කෙහෙල්, වැළ, වරකා, කසපැන් මේ ආදිය ද ලුණු, මිරිස්, ඉඟුරු, දුරු, අබ යන මෙකී සියල්ල ද මේ ක්‍රමයෙන් සතරවාසල් දොර රැස් කරවූහ."

ආදියේ සිට ම පොල් ඵලයට ව්‍යවහාර වූ නම් කලින් කලට වෙනස් වී ඇත. අනුරාධපුර යුගයේ දී පොල් හඳුන්වා ඇත්තේ 'නෙරළු පක් ' යනුවෙනි. අනුරාධපුර යුගයේ ලියැවුණු 'සිඛවළඳ විනිස' නම් ග්‍රන්ථයෙහි ඒ බව සඳහන් වේ.

ශ්‍රී ලාංකික ඉතිහාසයේ ලියැවුණු සෑම සංදේශ කාව්‍යයක ම පොල්වතු පිළිබඳ ව සඳහන් වී ඇත. ඒ සෑම සන්දේශ කාව්‍යයක ම පාහේ දූතයා පොල් වතු උඩින් අවට සිරි නරඹා ගිය බව සඳහන් වේ.

එදා දාගබින් යන රැස් කඳක් ලෙස
විදා පියා මග යන තෝ අහස් කුස
රඳා ගිය වලාකුළු සේ ගං දෙපස
සදා දිලෙන පොල් වතු දැක දකුණු පස

වර්ෂය ආරම්භයේ දී පවත්වන අත්‍යුත්කර්ෂවත් උත්සවයකි.

හංස සංදේශ කතුවරයා මේ පද්‍යයෙන් දූතයාට පවසන්නේ දකුණු දිශාවෙහි පිහිටි ගංගා දෙපස රඳවා ගිය වලාකුළු සේ පෙනෙන පොල් වතු දකිමින් පියාසර කරන ලෙස ය.

වර්තමානයේ මෙන් ම අතීතයේ දී ද විවිධ උත්සව සඳහා පොල් මල් කලස් සහ තැඹිලි යොදා ගෙන ඇති බවට සාක්ෂ්‍ය ඇත. ඒ බව '**කව්සිළුමිණ**' මහා කාව්‍යයේ සඳහන් වන්නේ මෙසේ ය.

හිමි පුළුප් කලස
පිවිතුරු ලකළ හෙම් කළ
සමෝ රඹ තැඹිලියෙන්
නවමල් සියෙන් රඳනා

මේ ගීයෙන් විස්තර වන්නේ එදා නුවර වැසියන්ගේ ගෙදර දොර උත්සව, රාජකීය උත්සව ආදි සෑම අවස්ථාවක දී ම නොයෙක් විසිතුරු මෝස්තරවලින් අලංකාර කිරීමට පුළුප් කලස් හා තැඹිලි යොදා ගත් බව යි.

ඉතිහාසයේ පොල් ගෙඩියේ උපත පිළිබඳ ව විවිධ ජනප්‍රවාද සඳහන් වී ඇත. ඒ අනුව ගණදෙවියන්ගේ හිසින් පොල් ගෙඩිය උපත ලබා ඇති බව ගණ දෙවි හැල්ලෙහි සඳහන් වේ. පහත දැක්වෙන පද්‍යයෙන් එය මනාව පැහැදිලි වේ.

තැන තැන කොතැන ද සිට විමසන්නේ
වෙන තැන තිබු දෙය සුදුසු නොවන්නේ
වන පෙත පළමුව තිබිණි කියන්නේ
ගණදෙවි හිස පොල් ගෙඩිය උපන්නේ

කිසියම් ප්‍රදේශයක පොල් වගාව සාර්ථක ලෙස සිදු කිරීමට නම් එයට අත්‍යවශ්‍ය පාරිසරික සාධක කිහිපයක් තිබිය යුතු ය. එනම් අඟල් 80ක පමණ වාර්ෂික වර්ෂාපතනය, ෆැරන්හයිට් අංශක 70-80 අතර වූ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය, පසෙහි තෙතමනය නිති රඳා පැවතීම, තෙතමනය සහිත ඝන දියලු පස හෝ වැලි මිශ්‍ර ලෝම පස (ලුණු මිශ්‍ර පසක් නම් වඩාත් උචිත ය) යනාදිය යි.

නිවර්තන දේශගුණයක් සහිත ශ්‍රී ලංකාව පොල් වගාව සාර්ථක ලෙස ව්‍යාප්ත වීමට අවශ්‍ය පාරිසරික සාධක මනා ලෙස සපුරා ඇති රටකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ 1962 වර්ෂය වන විට පොල් වගාව හෙක්ටයාර් දස ලක්ෂයක් පුරා ව්‍යාප්ත විය. භූමි ප්‍රමාණයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ විශාලතම වැවිලි වගාව පොල් ය. මෙරට පොල් ඉඩම් ප්‍රමාණයෙන් සියයට දහසයක් වියළි කලාපයේ ද සියයට හතළිහක් තෙත් කලාපයේ ද සියයට පනහක් අතරමැදි දේශගුණික ප්‍රදේශවල ද ව්‍යාප්ත වී ඇත. විශේෂයෙන් ම නිරිත දිග තැනි තලාවේ වෙරළාසන්න වැළි බිම් කලාපයන්හි ප්‍රධානතම ආර්ථික වගාව පොල් ය.

ඇතැම් ශ්‍රී ලාංකිකයන් විශ්වාස කරන්නේ දියවැල් ඔස්සේ පොල් මෙරටට සංක්‍රමණය වූ බව යි. එසේ ම ආදි නාවිකයන් මඟින් මෙරට පොල් වගාව ව්‍යාප්ත වූ බවට ද මතයක් ඇත. කෙසේ වෙතත් ඉතිහාසයේ සඳහන් වන අන්දමට ශ්‍රී ලාංකිකයන් පොල් වැවීමට උනන්දු කරවන ලද්දේ ලන්දේසි ජාතිකයන් විසිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1796 දී ලන්දේසි යුගය අවසන් වන විට හලාවත සිට දෙවුන්දර දක්වා මුහුදු බඩ තීරයෙහි අක්කර එක්ලක්ෂ හතළිස් දෙදහසක පමණ භූමි ප්‍රමාණයක පොල් වගාව ව්‍යාප්ත විය.

පාරිභෝගික වැවිල්ලක් වශයෙන් ගෙවතුවල වගා කළ පොල් ඉංග්‍රීසි යුගයේ දී එනම් ක්‍රි.ව 1860න් පසු ඉංග්‍රීසි ජාතිකයන් මෙරට වතුවගා ව්‍යාපාරය ඇරඹීමත් සමග ව්‍යාපාරික වැවිල්ලක් බවට පත්විය. ඒ අනුව 1860 දී පොල් වගාව අක්කර දෙලක්ෂ පනස් තුන් දහසක් පුරා පැතිරිණි. 1900 වර්ෂය වන විට එම ප්‍රමාණය අක්කර අටලක්ෂ පනස් දහසක් දක්වා වර්ධනය විය.

මහා පරිමාණ වගාවක් වශයෙන් ඇරඹි පොල්වගාව විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක තුනක් දැක ගත හැකි ය. එනම් ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයි. මේ කලාපය 'පොල් ත්‍රිකෝණය' ලෙස හැඳින්වේ. මේ ප්‍රදේශයන්හි පොල් වගාව සඳහා නවීන විද්‍යානුකූල වගාක්‍රම සහ පොහොර භාවිතය ක්‍රියාත්මක වේ.

පොල් ගස මෙරට ජන ජීවිතය සමග දැඩි ලෙස බැඳී පවතී. එය පොල් වගාව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශවල ග්‍රාම නාම දෙස බැලීමේ දී මනාව පැහැදිලි වේ.

පොල්ගොල්ල, පොල්පිතිගම, පොල්ගස්ඕවිට, පොල්හේන, පොල් අතුමෝදර, පොල්ග හවෙල, පොල්වත්ත යන ගම් එයින් කීපයකි. ශ්‍රී ලාංකිකයන් පොල් ගස හඳුන්වන්නේ 'කප් රුක' යන නමිනි. එලෙස හැඳින්වීමට හේතුව පොල් ගසෙහි සෑම කොටසකින් ම මිනිසාට ප්‍රයෝජනයක් ලබා ගත හැකි වීමයි.



පොල් යනු ශ්‍රී ලාංකිකයන්ගේ ආහාරපාන අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගෙන ඇති ඵලයකි. විශේෂයෙන් ශ්‍රී ලාංකිකයකුගේ ආහාර වේලෙහි අඩංගු කැලරිවලින් සියයට 4.6ක් ම ලැබෙන්නේ පොල් හා පොල්තෙල්වලිනි. පොල් ගෙඩියක මේද කොටස් සියයට හතළිස් දෙකකි. ප්‍රෝටීන හතරයි දශම හයකි. ජලය සියයට තිස් එකකි. තන්තු කොටස් සියයට හතරකි. පොල්වල අඩංගු මේ පෝෂ්‍ය පදාර්ථ අතුරින් තන්තු කොටස්වලින් ආහාර දිරවීමේ ක්‍රියාවලිය පහසු කරවයි. ශ්‍රී ලාංකිකයකුගේ ආහාර වේලක පොල් සම්බෝලයට හිමි වන්නේ විශේෂ ස්ථානයකි.

දිළිඳු පැල්පතේ සිට තරු පහේ හෝටලය දක්වා වෙනසකින් තොර ව පිළියෙල වන පොල් සම්බෝලයට බොහෝ දෙනා දැඩි රුචිකත්වයක් දක්වති. ව්‍යංජන වර්ග පිළියෙල කිරීමේ දී ද වෙනත් රස කැවිලි පිළියෙල කිරීමේ දී ද පොල් නැති ව ම බැරි ය.

පිපාසය සංසිඳවන රසවත් පානයක් ලෙස ද නොමේරූ අවධියෙහි පොල් ගෙඩිය හෙවත් කුරුම්බා ගෙඩිය බොහෝ ජනප්‍රිය ය. තව ද රා සහ අරක්කු නිෂ්පාදනය සඳහා ද පොල් ගස උපයෝගී කර ගැනේ.

ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීමේ දී විවිධාකාර ලෙස පොල් ගස ප්‍රයෝජනවත් වේ. නිවාස සහ වෙනත් ගොඩනැගිලිවල වහල සඳහා පරාල ලෙස පොල් ලීය භාවිත කෙරේ. එමෙන් ම සමහර අවස්ථාවල දොර ජනේල උළුවහු තනා ගැනීමේ දී ද පොල් ලී භාවිත කරනු දැකිය හැකි ය.

පරිසරය පිරිසිදු ව තබා ගැනීමේ දී ඉදලට සහ කොස්සට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. එම උපකරණ සෑදීමේ දී ඉරටු සහ පොල් කෙඳි ප්‍රයෝජනවත් වේ.

ඊට අමතර ව විවිධ කාර්යයන් සඳහා පොල් කොළ ප්‍රයෝජනවත් වේ. අතීතය හා සාපේක්ෂ ව බලන කල වර්තමානයේ පොල් ගසේ කොටස්වලින් නිපද වන කලා නිර්මාණ බහුල වී ඇත. ඉරටු කොහු , පොල් කටු , පොල් ලී වැනි දේවලින් කළ විචිත්‍රවත් නිර්මාණ රැසක් වෙසක් වැනි උත්සවවල දී පමණක් නො ව සාමාන්‍ය වෙළෙඳ පොළේ දී වුව ද දැකගත හැකි ය. මේ නිර්මාණවලට විදේශිකයෝ විශාල රුචිකත්වයක් දක්වති. ඒවා විදේශ විනිමය මෙරටට ගෙන එන මාර්ගයක් වී තිබේ.

පොල් ගස උපයෝගී කරගෙන නිෂ්පාදනය කෙරෙන විසිතුරු භාණ්ඩවලට වර්තමානයේ හොඳ විදේශ ඉල්ලුමක් පවතී. එමෙන් ම කොප්පරා, පොල් තෙල් හා පොල් ගෙඩි අපනයනයෙන් ද ශ්‍රී ලංකාවට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ලැබේ. සබන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ෆ්ලෝරික් අම්ලය සියයට හතළිස් අටක් පොල්වල අඩංගු වේ.

අපේ මුතුන් මිත්තන් තමන් විසින් නිර්මාණය කරන ලද චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා පොල් වතුර උපයෝගී කරගෙන ඇති බවට ඉතිහාසය සාක්ෂ්‍ය දරයි. පුරාවිද්‍යාඥ පී. ඊ. පී. දැරණියගල මහතා පවසන අන්දමට සීගිරි චිත්‍ර ඇඳීමට යොදාගත් බදාම සාදාගෙන ඇත්තේ හුඹස් මැටි, දහයියා, මකුළු, පැණි, කොහු හා කසපැන් මිශ්‍ර කිරීමෙනි.මෙහි කසපැන් නමින් හඳුන්වා ඇත්තේ පොල් වතුර ය.

ශ්‍රී ලාංකික සංස්කෘතිය සමඟ දැඩි ලෙස බැඳී පවතින පොල් කොළ රටා එද මෙන් ම අදත් මෙරට මෙන් ම පිටරට ද ජනතාව අතර ජනප්‍රිය ය.

### අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| මහා වංසයෙහි | . | ශ්‍රී ලංකාවෙහි ඉතිහාස ගත තොරතුරු ඉදිරිපත් කෙරෙන ග්‍රන්ථයෙහි |
| ථූප වංසයෙහි | . | රුවන්වැලි සෑය පිළිබඳ ඉතිහාසය විස්තර කෙරෙන පැරණි සාහිත්‍ය ග්‍රන්ථයෙහි |
| පර්ෂදට | . | පිරිසට |
| පිළිසම්බඩම් | . | රෙදි පොදි |
| පුළුප් කලස් | . | පොල් මල් යෙදූ කළ / පුන් කලස |

## ක්‍රියාකාරකම 01

i. පොල් ගස හැඳින්වීමට මේ පාඩමේ යෙදී ඇති නම් මොනවා ද?

ii. 'පොල් ගස අපේ රටට සංක්‍රමණය වූවකි.' මේ කියමන පැහැදිලි කරන්න.

iii. කුරුම්බැට්ටියේ සිට මුහුකුරා යන තෙක් පොල් ගෙඩියේ විවිධ අවස්ථා හැඳින්වෙන නම් කවරේ ද?

iv. පොල් ගසේ විවිධ කොටස් අපේ මංගල, අවමංගල හා ගෘහ ජීවිතය සමඟ බැඳී පවතින බව දැන්වීමට නිදසුන් දෙකක් බැගින් දෙන්න.

v. පොල් ත්‍රිකෝණය යන්න හැඳින්වීම සඳහා වචන දහයකට නො අඩු වාක්‍යයක් ලියන්න.

## ක්‍රියාකාරකම 02

අ) 'විජය රජතුමා ලංකාවට පැමිණීම' යන අදහස සඳහා පාඩමේ 'විජයාවතරණය' යන වචනය යෙදී තිබුණි. 'විජයාවතරණය' යන්න 'විජය රජතුමා ලංකාවට පැමිණීම' යන වචන කිහිපය වෙනුවට යෙදිය හැකි තනි වචනයකි. එසේ අදහස් කිහිපයක් සඳහා ගැළපෙන තනි වචනයක් ඉදිරිපත් කිරීම සාරාංශකරණයේ දී අවශ්‍ය වේ. අදහස් සමූහයක් කෙටියෙන් තේරුම් ගැනීම ද, කෙටියෙන් ලියා ඉදිරිපත් කිරීම ද ලිපි ලේඛන හා පොතපත කියවීමේ දී එහි අන්තර්ගතය සාරාංශ කර ගැනීම ද සඳහා එය මහෝපකාරී වෙයි. එම නිපුණතාව සංවර්ධනය කර ගැනීම උදෙසා මේ ක්‍රියාකාරකම්වල නියැලෙන්න.

01. මේ එක් එක් වාක්‍යාංශය සඳහා යෙදිය හැකි තනි පද යොදා වාක්‍යය බැගින් ලියන්න.

i. රජවරුන්ට අයත්
ii. පොදු ජනයා අතර මුඛ පරම්පරාවෙන් පැවත එන කතා
iii. පරිසරයට අයත්
iv. මුහුදු වෙරළට සමීප
v. ලන්දේසීන් මෙරට පාලනය කළ වකවානුව
vi. පරිභෝජනය කළ
vii. බොහෝ ප්‍රදේශයන් අතර ප්‍රසිද්ධ
viii. එකිනෙකට බද්ධ ව / සම්බන්ධයක් ඇතුව

(ආ) පොල් ගෙඩි අපනයනයෙන් ශ්‍රී ලංකාවට හොඳ විදේශ විනිමයක් ලැබෙයි.
ඉහත ඉදිරිපත් කර ඇති වාක්‍යයේ 'හොඳ' යන පදයෙන් 'ඉහළ' යන අදහස ගෙන දෙයි. පහත සඳහන් එක් එක් වාක්‍යයේ හොඳ යන යෙදුමෙන් ඉස්මතු වන අර්ථය ලියන්න.

i. කලකට පසු ඔහුට උද වී ඇත්තේ හොඳ කාලයකි.
ii. හොඳ ළමයි විනීත ව හැසිරෙති.
iii. නිසි ප්‍රතිකාර නිසා රෝගය හොඳ විය.
iv. හොඳ අකුරින් ලියූ පිළිතුරු ද නිවැරැදි ය.
v. රෝපණය සඳහා හොඳ පැළ අවශ්‍ය විය.
vi. පදිංචිය සඳහා හොඳ පළාතක් තෝරා ගැනිණි.
vii. පියල් ගමේ පදිංචිය සඳහා හොඳ නිවෙසක් ඉදි කළේ ය.
viii. හොඳ පලතුරු ආහාරයට යෝග්‍ය ය.

## ක්‍රියාකාරකම 03

1. පාඩම කියවා සමස්ත අන්තර්ගතයට ගැළපෙන සිත් ගන්නාසුලු කෙටි මාතෘකා පාඨයක් ලියන්න. පසු ව පන්තිය ඉදිරියේ එය ප්‍රකාශ කරන්න.

2. පොල් ගස් පිළිබඳ වාක්‍ය රචනයක් ලිවීම සඳහා උපකාරී කර ගැනීමට හැකි වන සේ පාඩමේ අන්තර්ගත මූලික කරුණු සාරාංශ කර ලියා ඉදිරිපත් කරන්න.

3. කණ්ඩායම් වශයෙන් පන්තිය සංවිධානය වී මේ පාඩම නිශ්ශබ්ද ව හා ඉක්මනින් කියවා,

- පොල් ගස හා සබැඳි ඓතිහාසික විත්ති
- පොල් වගාවට අවශ්‍ය පාරිසරික සාධක
- ශ්‍රී ලංකාවේ පොල් වගාව
- පොල් ගසෙහි ප්‍රයෝජන
- මිනිස් සිරුරට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සැපයීම
- ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයට ප්‍රයෝජනවත් වීම
- විවිධ උපකරණ හා භාණ්ඩ සැකසීම
- කලා නිර්මාණ

යන මාතෘකා ඒ ඒ කණ්ඩායම් බෙදාගෙන තෝරාගත් මාතෘකාව යටතේ පාඩමේ අන්තර්ගත කරුණු සාරාංශ කර ලියා ඉදිරිපත් කරන්න.

4. 'සාරාංශය යනු කිසියම් කොටසක අන්තර්ගත හරය එහි වචන සංඛ්‍යාවෙන් 1/3කට හකුළුවා ඉදිරිපත් කිරීමයි.'

ඒ අනුව මේ එක් එක් ඡේදය එහි වචන සංඛ්‍යාවෙන් 1/3ක් වන සේ සාරාංශ කර ලියන්න.

i. ලොව බහුතර ජනතාව විශ්වාස කරන්නේ මලයාසියාවේ හට ගන්නා පොල් අවට සාගරයේ දියරැලිවල පාවී ගොස් සැම රටක ම ව්‍යාප්ත වන්නට ඇති බවයි.

ii. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ලියවුණු සැම සන්දේශ කාව්‍යයක ම පාහේ පොල් වතු පිළිබඳ ව සඳහන් වී ඇත. ඒ සැම සංදේශ කාව්‍යයක ම දූතයා පොල්වතු උඩින් අවට සිරි නරඹා යැවීමට සලස්වා තිබේ.

iii. ගණ දෙවියන්ගේ හිසින් පොල් ගෙඩිය උපත ලබා ඇති බව ගණ දෙවි හෑල්ලෙහි සඳහන් වේ. ගණ දෙවි හිසින් පොල් ගෙඩිය උපන්නේ යැයි පවතින මතය නිසා ගණ දෙවියන් ඉදිරියේ පොල් ගැසීමේ චාරිත්‍රය අදත් පවතී.

iv. ආදි නාවිකයන් මඟින් මෙරට පොල් වගාව ව්‍යාප්ත වූ බවට ද මතයක් ඇත. කෙසේ වෙතත් ඉතිහාසයේ සඳහන් වන අන්දමට ශ්‍රී ලාංකිකයන් පොල් වැවීමට උනන්දු කරවන ලද්දේ ලන්දේසි ජාතිකයන් විසිනි.

### පැවරුම්

- **අපේ කප් රුක වටා නිර්මාණය වී ඇති ජනකවි, ජනකතා, භාෂා යෙදුම් හා ගීත එක් රැස්කර පන්තියට ඉදිරිපත් කරන්න.**